# සැබෑ වූ සිහිනය



මින්දිනී දෙහංසා චන්සිළුනි සුභසිංහ

# සැබෑ වූ සිහිනය

## මින්දිනී දෙහංසා වන්සිළුනි සුභසිංහ

### කතෘගේ වෙනත් කෘති

- හොඳ යාළුවෝ
- කම්මැළි සිඟිති

මහමායා බාලිකා විද්‍යාලය - මහනුවර
5 ශ්‍රේණිය B
2025.02.08

ISBN 978-624-208-832-7

# පිදුම

"සිහිනයට නාවත් සුදු ඇත්තු
බෝසතෙක් මෙන් මා රැකගත්තු අම්මාට...

හිස මත නොදුටුවත් මිණි ඔටුනු
රජෙක් වාගෙම මට පෙනුණු
තාත්තාට...

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි.

පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.
ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටෙ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.


විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.



එක්තරා ගමක පුංචි ගෙයක් තිබුණා.ඒ ගෙදර හිටියේ බිංදුයි බිංදුගේ අම්මයි විතරයි. බිංදු දුප්පත් ළමයෙක් ඒ වුණාට එයා දක්ෂයි,අහිංසකයි. දුප්පත් නිසා බින්දුට යාලුවෝ හිටියේ නැහැ. පන්තියේ, යාලුවෝ බිංදුට බනිනවා ගහනවා.සෙල්ලම් කරන්න ගන්නේ නැහැ. ඒ නිසා බිංදු හිටියේ හරිම දුකෙන්.

එදා තද වැස්ස දවසක්. බිංදුගේ අම්මා බිංදුට පාසල් යන්න කතා කළා. බිංදු දුවේ නැගිටින්න.අද යන්න බැහැ අම්මේ.බිංදු කිව්වා. එහෙම ඉස්කෝලෙ යන්නේ නැතුව ඉන්න බැහැනේ දුවේ.අම්මා කිව්වා. කුඩයකුත් නැති එකේ ගෙදරට වෙලාම ඉන්නම් අම්මේ. බිංදු යළිත් කිව්වා. හබරල කොළයක් හරි කඩාගෙන යමු දුවේ.

බිංදු පාසල් යන්න අකමැති වුණේ, යහළුවන්ගේ කරදර නිසාය නැතිනම් පාසල් යන්න අකමැති නිසාම නොවේ. කෙසේ වුවත් බිංදුගේ අම්මා වැස්සේම බින්දු පාසලට ඇරලුවා. තෙමීගෙන එන බිංදුට යහළුවෝ විහිළු කරන්න පටන් ගත්තා ඔන්න එනවා අදත් තෙමී ගෙන කුඩයක්වත් තියෙන එකක් ඈ සකුණි කිව්වා. කුඩ ගන්න තියා කන්න අරන් යන්නෙත් බොහොම ආමාරුවෙන් තවත් කෙනෙක් කියනවා බිංදුට ඇහුණි.



නමුත් බිංදු කිසිවක් නොකියා නිහඬව පන්තියේ වාඩි වුණා.

ටික වේලාවකින් ගුරුතුමී පංතියට එනු දුටු යහළුවන් දුවගෙන ගොස් බිංදු තෙමී ගෙන ඇවිත් වාඩි වී සිටින බව ගුරුතුමීට කිව්වා. ටීචර් ,ටීචර් අදත් බිංදු තෙමී ගෙන ඇවිත් වාඩි වීගෙන ඉන්නේ. ඉතින් මොකද බින්දු හොඳටම තෙමිලා නැනේ වැස්සේම හරි පාසල් ආවේ බිංදු හොඳ ළමයෙක් ගුරුතුමී කීවාය .
ඒ වචන ටික ඇසුණු බිංදුගේ සිතට සතුටක් ඇති විය. යාලුවෝ කවුරු කවුරු නැති වුණාට තම ගුරුතුමී තමාට ගොඩක් ආදරේ බව බින්දු දනී. කොහොම වුවත් බිංදු වෙනදා වගේ තමාගේ වැඩ කොටස ඉතා හොඳින් කිරීමට මහන්සි ගත්තාය
පන්තියේ අනිත් ළමයින්ට වඩා වැඩියෙන් ලකුණු ගත්තේ ද බිංදුයි. එයටද අනෙක් යහළුවන් හිටියේ හරිම තරහින්. ශිෂ්‍යත්ව විභාගය ළඟ ළඟම එන නිසා වැඩියෙන් වැඩකරන්න පාඩම් කරන්න යැයි ගුරුතුමී නිතර උපදෙස් ලබා දෙයි ඒ නිසා අම්මා වැඩ ඇරී ගෙදර එන තෙක් ගේ දොර වැඩද අවසන් කර පොත පතේ වැඩවල නිරතවීමට අමතක නොකළාය.
සෙල්ලම් කිරීමට තමාරට යහළුවන් නොමැති නිසා බින්දු නිතරම පොත පතේ වැඩවල නිරතවීම හා අමතර පොත්පත් කියවීමට පුරුදු විය.
පසු දින පාසල් යන විට එදා උදෑසන රැස්වීම තිබුනේ බිංදුගේ පන්තියටයි.
පන්තිභාර ගුරුතුමී අද උදෑසන රැස්වීමේ දවසේ කතාව කරන්නේ කවුරුන්දැයි ළමයින්ගෙන් ඇසීය.
.


ඉතින් මොකද බිංදු හොඳටම තෙමිලා නැනේ වැස්සේම හරි පාසල් ආවේ බිංදු හොඳ ළමයෙක් ගුරුතුමී කීවාය.

ඒ වචන ටික ඇසුණු බිංදුගේ සිතට සතුටක් ඇති විය. යාලුවෝ කවුරු කවුරු නැති වුණාට තම ගුරුතුමී තමාට ගොඩක් ආදරේ බව බිංදු දනී. කොහොම වුවත් බිංදු වෙනදා වගේ තමාගේ වැඩ කොටස ඉතා හොඳින් කිරීමට මහන්සි ගත්තාය.

පන්තියේ අනිත් ළමයින්ට වඩා වැඩියෙන් ලකුණු ගත්තේ ද බිංදුයි. එයටද අනෙක් යහළුවන් හිටියේ හරිම තරහින්,

ශිෂ්‍යත්ව විභාගය ළඟ ළඟම එන නිසා වැඩියෙන් වැඩ කරන්න පාඩම් කරන්න යැයි ගුරුතුමී නිතර උපදෙස් ලබා දෙයි ඒ නිසා අම්මා වැඩ ඇරී ගෙදර එන තෙක් ගේ දොර වැඩද අවසන් කර පොත පතේ වැඩවල නිරතවීමට අමතක නොකළාය.

සෙල්ලම් කිරීමට තමාරට යහළුවන් නොමැති නිසා බිංදු නිතරම පොත පතේ වැඩවල නිරතවීම හා අමතර පොත්පත් කියවීමට පුරුදු විය.




අද කතාව තියෙන්නේ බිංදුටයි, මනුකී කීවේ බිංදු අපහසුතවයකට පත්පත් කිරීම සදහා ය.
ඔව් ටීචර් මම කතා කරන්නම් බිංදු උත්තර දුන්නාය බිංදු කතාව පටන් ගත්තා.

විදුහල්පතිතුමාගෙන්ද, පන්ති භාර ගුරුතුමියගෙන්ද අනෙකුත් ආචාර්ය මණ්ඩලයෙන්ද අවසරයි.
ආදරණීය සහෝදරියනි, අද කතා කරන්න යන්නේ යන්නේ මම ගැනයි කියා කතාව පටන් ගත්තා ය.
මම දුප්පත් ළමයෙක්, මම හිතනවා මගේ දුප්පත්කම ඉගෙනීමට බාධාවක් නොවෙයි කියලා.
මට ඕනෑ කරන්නේ පන්තියේ නිදහසේ ඉගෙන ගන්න.ඔයාලා වගේම නිදහසේ ඉන්න සෙල්ලම් කරන්න අනේ මටත් ඉඩ දෙන්න නිදහසේ හුස්ම ගන්න,නිදහසේ පන්තියේ ඉගෙන ගන්න. මම ඔයාලා හැමෝගෙන්ම ඉල්ලන්නේ එච්චරයි.

කතාව අවසානයේ සියලුම දෙනාගේ දෙනෙත් වලින් කඳුළු වැටෙන්නට විය පන්තිභාර ගුරුතුමී බිංදුගේ සියලු ගැටලු දැන ගත්තේ එදාය. බිංදු ඒ වන තෙක් මුහුණ දීමට සිදු වූ ගැටලු කිසිදු කෙනෙකුට පවසා නොතිබුණි.



පන්තිභාර ගුරුතුමී බිංදුව තුරුළු කර ගෙන හොඳින් විභාගය ලියන ලෙසට ආදරයෙන් පැහැදිලි කර දුන්නාය.
පන්තියේ අනෙක් ළමුන්ද බිංදුට ආදරය කළෝය.



ශිෂ්‍යත්ව  විභාගය ලියා අවසන් කළ බිංදුට පාසල් නිවාඩු කාලය උදා විය නිවාඩු කාලය තුළ බිංදු ගෙදර සිටින්නේ තනියම නිසා අම්මා සමග යාමට බිංදු පුරුදුව සිටියාය.  එහිදි අම්මාගේ වැඩ වලට උදවු  කරන  බිංදු  ඒ අසල  ඇති වතුර  ගලා ගෙන  බසින ඇළෙහි සෙල්ලම්  කරයි. ලස්සන ගල් කැට එකතු කරමින් සෙල්ලම්  කරන  බිංදු එම ගල් කැට ගෙදර ගෙන ඒමට පුරුදුව සිටියාය.

පාසල් නිවාඩුව අවසන් වනවාත් සමඟ  ශිෂ්‍යත්ව විභාග ප්‍රතිඵල පැමින තිබුණි. එදා බිංදු  පාසල් යන විට කවරුත් කතා වුනේ  ශිෂ්‍යත්ව විභාග  ප්‍රතිඵල ගැනැයි. බිංදු  වහා පන්ති භාර ගුරුතුමිය ළගට දුව ගෙන ගියාය.

ටිචර්, ටිචර්  මගේ ප්‍රතිඵල  ගැන  මම දන්නේ නැහැනේ යැයි පවසනවාත් සමග ම තම ගුරුතුමිය බිංදු ව සිප ගනිමින්, පුතේ ඔයා තමයි ලකුණු 195 ක් ලබා  ගෙන ලංකාවෙන්ම ප්‍රථමයා වෙලා තියෙන්නේ.

එය ඇසූ බිංදුට සතුට දරා ගත නොහැකි තරම් විය. පාසලේ සියලු ගුරු භවතුන්ගේ ආදරය බිංදු ට ලැබුණි. මෙම සුභ ආරංචිය අම්මාට පවසන තුරු බිංදු සිටියේ නොයිවසිල්ලෙනි.

වෙනදා මෙන් පාසල ඇරී වේගයෙන් දුව ගියේ තම මව වැඩ කරන තැනටය.





බිංදු වේගයෙන් දුව ගෙන එනු දුටු අම්මා බිංදු ළගට දූව ගෙන ආවාය අම්මේ අම්මේ මම ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 195 ක් ලබා ගෙන ලංකාවෙන්ම පළමු වෙනියා වෙලා තියෙන්නේ.

මේ කතාව ඇසූ අම්මාගේ සතුට වැඩි නිසාම
බිංදු බදා ගෙන අඬන්නට විය
මම දන්නවා මගේ පුතා දක්ශයෙක් කියලා අම්මා කිව්වාය.

ඉතින් බිංදුයි අම්මයි සතුටින් ගෙදර ආවා.

ගෙදර ඇවිත් අම්මා කල්පනා කරන බව දැකපු බිංදු ඇයි අම්මේ දුකෙන් වගේ කල්පනා කරන්නේ යැයි ඇසීය? නැහැ පුතේ මම මේ කල්පනා කරන්නේ ඔයා හොඳින් විභාගය සමත් වුණා ඒත් කෝ අපට ලොකු ඉස්කෝලයකට යන්න සල්ලි අම්මා කිව්වා.

ඒකට කමක් නෑ අම්මේ මම මේ ඉස්කෝලෙම ඉන්නම් බිංදු කිව්වා.

බිංදුගේ නිවසේ වසා ඇති පොල් අතු සිදුරු අතරින් වැටී එන ලා හිරු රැසින් බිංදු ගෙනවිත් තිබුණු ගල් කැටයක් දිලිසෙණු දුටු බින්දු වහා එතනට දුව ගෙන ගොස් ගල අතට ගෙන අම්මේ මේ ගල් කැටය දිලිසෙනවා යැයි කීවාය.



ගල් කැටය අතට ගත් අම්මා අනේ මගෙ දුවේ මේ මැණික් ගලක්!

මෙය ඇසුණු බිංදු  අත්පුඩි ගසමින්  අපි දිනුම් අපි  දිනුම් අම්මේ  අපේ සිහිනය සැබෑ වුණා කියා කෑ ගසන්නට විය.





# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්තැවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවත් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාශිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

ISBN 978-624-208-832-7